# ඔබ සතර සතිපට්ඨානය වඩන්නේ නම් මේ ජීවිතයේ දී ම රහත් බව හෝ අනාගාමී බව කැමති විය යුතුය

## අඤ්ඤා සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, සංයුක්ත නිකාය 5 - i - පිටු අංක 324 - 325)

**සතිපට්ඨාන සතරකි. කවර සතරක් ද යත්;**

- කෙලෙස් තවන වැර ඇති ව මනා සිහි නුවණින් යුතු ව දැඩි ලෝභය සහ දොම්නස දුරු කොට කයෙහි කය අනුව බලමින් වාසය කරයි.
- කෙලෙස් තවන වැර ඇති ව මනා සිහි නුවණින් යුතු ව දැඩි ලෝභය සහ දොම්නස දුරු කොට වේදනාවෙහි වේදනාව අනුව බලමින් වාසය කරයි.
- කෙලෙස් තවන වැර ඇති ව මනා සිහි නුවණින් යුතු ව දැඩි ලෝභය සහ දොම්නස දුරු කොට සිතෙහි සිත අනුව බලමින් වාසය කරයි.
- කෙලෙස් තවන වැර ඇති ව මනා සිහි නුවණින් යුතු ව දැඩි ලෝභය සහ දොම්නස දුරු කොට ධර්මයෙහි ධර්මය අනුව බලමින් වාසය කරයි.

මේ සතර සතිපට්ඨානය වැඩූ විට, බහුල වැඩූ විට පහත ඵල දෙකින් එකකට කැමති විය යුතුය.

මේ ජීවිතයේ දී ම රහත් බව හෝ උපධි ශේෂයක් ඇති කල්හි අනාගාමී බව වෙයි.